**ශීර්ෂය - 242 - කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 16 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**---------------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාවිසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**----------------------**

**2.1 අග්‍රිම කළමණාකරනය**

**---------------------------**

| | විගණන නිරීක්ෂණය<br>------------------------------ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව සකස් කරන ලද අග්‍රිම සැලසුම අනුව, දෙසැම්බර් මාසයේ භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කල යුතු අග්‍රිමය රු 8,680,000 ක් වූ අතර ඉල්ලුම් කල අග්‍රිමය රු. 10,548,000 ක් විම හේතුවෙන් රු1,868,000 ක විචලතාවයන් නිරීක්ෂණය වූ අතර, එය ඉල්ලුම් කල යුතු අග්‍රිමයෙන් සියයට 22 ක ප්‍රතිශතයක් ගනු ලැබීය. | සලසා ඇති අයවැය ප්‍රතිපාදන පදනම්ව එක් එක් මාසයේ අපේක්ෂිත වියදම් අනුව අග්‍රිම සැලසුම සකස් කලද, අදාල මාසයේ සත්‍ය වශයෙන්ම දැරීමට සිදුවන වියදම් අනුව වාර්ෂික අක්මුදල් සීමාවට යටත්ව අග්‍රිම ඉල්ලුම් කිරීමට කටයුතු කර ඇත. | වාර්ෂික ඇස්තමේන්තු තාත්ත්වික හා ඵලදායී ලෙස සකස් කිරීමට අවශ්‍ය පියවර ගැනීමේ අවශ්‍යතාවය |

**2.2 වියදම් කළමනාකරණය**

**---------------------------**

| | විගණන නිරීක්ෂණය<br>------------------------------ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම් සඳහා රු. 1,350,000 ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණු අතර වර්ෂයේ සත්‍ය වියදම රු. 114,181 ක් වීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 92 ක් වී තිබුණි. | කොවිඩ් 19 හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කල පරිදි සිදු කිරීමට අපොහොසත් වීම නිසාත් (වැය විෂය අංක 2102) අරපිරිමැසුම්දායී ලෙස වාහන නඩත්තු කිරීම නිසාත් (වැය විෂය අංක 2003) පුහුණු අවස්ථා සඳහා ඉල්ලු කිරීමට හා පුහුණු අවස්ථා සැලසුම් | වාර්ෂික ඇස්තමේන්තු තාත්වික හා ඵලදායි ලෙස සකස් කිරීමට පියවර ගැනීමේ අවශ්‍යතාවය |

| | | | |
|---|---|---|---|
| | | කිරීමට නොහැකි වීම නිසාත් (වැය විෂය අංක 2401) මූලධන ප්‍රතිපාදන ඉතිරිව ඇත. | |
| (ආ | 1101හා 2401 යන වැය විෂයයන් යටතේ මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදන පිළිවෙලින් රු.100,000 හා රු.150,000 ක මුදලක් වර්ෂය අවසානයේ වියදම් නොකර ඉතිරි වී තිබුණි. | කෝවිඩ් 19 තත්ත්වය යටතේ පුහුණු අවස්ථා සඳහා ඉල්ලු කිරීමට හා පුහුණු අවස්ථා සැලසුම් කිරීමට නොහැකි වීම මත ප්‍රතිපාදන ඉතිරිවීම. | වාර්ෂික ඇස්තමේන්තු තාත්වික හා ඵලදායි ලෙස සකස් කිරීමට පියවර ගැනීමේ අවශ්‍යතාවය |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදි වැය විෂයයන් 10 ක් සඳහා රු.මිලියන 8.032 ක අධි ප්‍රතිපාදන සලසා තිබිම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු රු.මිලියන 2.95 ක ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 99 ක පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | කොවිඩ් 19 වසංගතය හා අරපිරිමැසුම්දායී ලෙස ප්‍රතිපාදන භාවිතා කිරීම නිසා අරමුදල් ඉතිරි වී තිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු තාත්වික හා ඵලදායි ලෙස සකස් කිරීමට පියවර ගැනීමේ අවශ්‍යතාවය |

## 2.3. බැරකම් හා බැඳීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.30,891 ක බැරකම් මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත වී හෝ බැරකම් ලේඛණයේ සටහන් වී හෝ නොමැති බව නිරීක්ෂණය විය. | අදාල වවුචරය ඉදිරිපත් කරන දිනට වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර අවසන් කර ඇති බැවින් මූල්‍ය ප්‍රකාශවල බැරකම් ලෙස ඉදිරිපත් කර නොමැත. | බැරකම් නිසි පරිදි මූල්‍ය / ප්‍රකාශන තුල ඉදිරිපත් කලයුතු බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**3.1.1. සැලැසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 3 (ආ) ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී වර්ෂයට අදාල අනුමත කාර්යමණ්ඩලය හා දැනට සිටින කාර්යමණ්ඩලය, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම, වර්ෂය තුල වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කල ක්‍රියාකාරී සැලැස්ම තුල අන්තර්ගත කර නොතිබුණි. | අදාළ අඩුපාඩු නිවැරදි කර රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2014 ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ඉදිරියේ දී සකස් කිරීමට සටහන් කර ගතිමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු වීම. |

**3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරිම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |

(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුල ස්ථාපිත කර තිබූ පහත සදහන් අරමුණු හා ඒ හා සම්බන්ධ කාර්යසාධන දර්ශක දෙපාර්තමේන්තුව විසින් ඉටු කර ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

| | | |
|---|---|---|
| (i) 2017.08.15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව , කාර්තුමය වශයෙන් යාවත්කාලීන කරන ලද සේවක තොරතුරු, අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම යටතේ පිහිටුවා ඇති 2019 සහ 2020 වර්ෂවල දෙවන තෙවන හා සිව්වන කාර්තුවල, සේවක වාර්තා ඉදිරිපත් කිරීම . | කොවිඩ් 19 වසංගත තත්ත්වය පැතිරීමේ ප්‍රතිඵලයක් ලෙස තොරතුරු නිසි පරිදි වෙනත් ආයතන වෙතින් නොලැබීම හේතුකොට ගෙන අදාළ තොරතුරු ඉදිරිපත් කිරීමට නොහැකි විය. | කාර්යභාරයන් යම් නියමිත කාලවකවාණුව තුල සම්පූර්ණ කලයුතු වීමේ අවශ්‍යතාවය |
| (ii) 2019.12.31 දිනට රාජ්‍ය සේවා මානව සම්පත් තොරතුරු ප්‍රසිද්ධ කිරීම හා 2020 වර්ෂයේ රාජ්‍ය සේවා මානව සම්පත් සම්බන්ධ තොරතුරු ඇතුලත් කරමින්,දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන යාවත්කාලීන කර නොතිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය තුල අනෙකුත් අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනවලින් තොරතුරු ලබා ගැනීමේ දුෂ්කරතාවය මතුවීම හේතුවෙන් අදාළ ප්‍රකාශ යාවත්කාලීන කිරීමට නොහැකි විය. | කාර්යභාරයන් යම් නියමිත කාලවකවාණුව තුල සම්පූර්ණ කලයුතු වීමේ අවශ්‍යතාවය |
| (iii) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධන වාර්තාව ඇතුළත් කරමින් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය යාවත්කාලීන කර නොතිබුණි. | 2020 වර්ෂය සදහා වූ ක්‍රියාකාරී සැලැස්ම හා කාර්ය සාධන වාර්තා ඇතුලත් කර වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාමට සටහන් කර ගතිමි. | වෙබ් අඩවිය නිසිපරිදි යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය |

## 4. මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

## 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

---------------------------------------------------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වෙනුවෙන් රු. 57,838,008 වැය කර තිබුණි | නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. | |
| (ආ) | ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු වී පවතින මානව සම්පත් කළමණාකරන විශේෂඥ තනතුර, වැඩ අධ්‍යයන විශේෂඥ තනතුර හා නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ තනතුරු 02ක්, 2019 වර්ෂයේ සිට පැවත එන අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු, ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 40 ක ප්‍රතිශතයක් ගන්නා බැවින් එය දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට බලපෑ හැකි බව නිරීක්ෂණය විය. | නියෝජ්‍ය හා සහකාර අධ්‍යක්ෂ තනතුරුවල පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් වෙත දැනුම් දී ඇතත් මෙතෙක් නිලධාරීන් ලබාදීමක් සිදුවී නොමැත. | දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව විධිමත් පරිදි පවත්වා ගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) | තවද ද්විතික මට්ටමේ සංවර්ධන නිලධාරී තනතුරු 03 ක් ද, කළමණාකරණ සේවා නිලධාරි 02 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු වී පවතින රියදුරු තනතුරු 02 ක් හා කාර්යාල කාර්ය සහයක තනතුරු 01 ක් ලෙස තනතුරු 8 ක්ද පුරප්පාඩුව පැවතුණි. | රියදුරු හා කාර්යාල කාර්ය සහයක තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙසට ද දැනුම් දී ඇත. | දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව විධිමත් පරිදි පවත්වා ගැනීමට කටයුතු කිරීම. |